යම් කිසි පුවතකට සෘජුවම අදාළ නොවන්නේ නම් පුද්ගලයෙකුගේ හෝ පුද්ගල කණ්ඩායමකගේ වාර්ගිකත්වය පුවත හෝ ලිපිය සමඟින් සඳහන් නොකළ යුතු බව දෙස් විදෙස් මාධ්‍ය ආචාර ධර්ම තුළ සඳහන් වේ. මෙවැනි මාධ්‍ය ආචාර ධර්මයක අවශ්‍යතාවය වන්නේ, යම් වාර්ගිකත්වයන් සම්බන්ධ කොට ගනිමින් ඒකාකෘතික කිරීම් ඇතිවීම වැළැක්වීමයි.

මෙම පසුතලය තුළ, දිවයින පුවත්පතේ (මැයි 01, 2022), "අරගලය අස්සේ පිස්සු කෙළින මිනිස්සු..." යන සිරස්තලය සමගින් පළවූ ලිපියේ වාර්ගිකත්වය සඳහන් වී ඇති ආකාරය විමසා බැලීම වටී.

ඔබ සිතනා ආකාරයට,

1) "මෙම මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් බහුතරයක් මුස්ලිම් අය" යැයි මෙහි සඳහන් වී ඇත. එම වාර්ගිකත්වය මෙම ලිපියට අදාළ වන්නේ කෙසේද?

2) එසේ වාර්ගිකත්වයක් සෘණාත්මක ලෙසින් ඉස්මතු කොට දැක්වීම සඳහා යම් කිසි පදනමක් තිබෙන්නේ ද? එසේ නැති නම්, එය යම් වාර්ගිකත්වයක් සෘණාත්මක ලෙස ඒකාකෘතික කොට දැක්වීමක් නොවන්නේ ද?

ඔබේ අදහස?